# ශ්‍රී ලංකාවේ දක්ෂිණ දිග සංචාරක කලාපයේ සංචාරක කර්මාන්තය ආශ්‍රිත කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනය පිළිබඳ අධ්‍යයනයක්

ඕ. එච්. ඒ. එම්. විජේරත්න
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
madushiwijerathna9275@gmail.com

සංචාරක කර්මාන්තය සංවර්ධිත මෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථිකයේ වැදගත් අංගයක් බවට පත්වී ඇත්තේ එය රටේ ජාතික ආර්ථිකයට වැදගත් දායකත්වයක් සපයන බැවිනි. එනිසාම එම රටවල සංචාරක කර්මාන්තය ආශ්‍රිතව කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත අංශයද සංවර්ධනය වී ඇත. ශ්‍රී ලංකාවේ දක්ෂිණ දිග වෙරළ කලාපයේද සංචාරක කර්මාන්තය ආශ්‍රිත කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත වැඩි වශයෙන් ව්‍යාප්ත වී ඇති අතර ලී කැටයම්, ස්වර්ණාභරණ, බතික්, අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදනය සහ බීරලු රේන්ද නිෂ්පාදන මේ අතරින් වැදගත් වේ. එම අංශයේ සංවර්ධනය සඳහා සංචාරක කර්මාන්තයේ දායකත්වය පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ විය. මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම උදෙසා අවශ්‍ය දත්ත ද්විතීයික සහ ප්‍රාථමික මූලාශ්‍ර මගින් ලබාගන්නා ලදි. අධ්‍යයන නියදිය සංචාරක කර්මාන්තය ආශ්‍රිත කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත, නිෂ්පාදන අළෙවිසැල් මෙන්ම සංචාරකයන් යනාදී ලෙස සමස්ත නියදිය 61ක් විය. ඒ අනුව සංචාරක කර්මාන්තය ආශ්‍රිත කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත ආශ්‍රිත අයිතියේ ස්වභාවය, වෙළෙඳපොළ තත්ත්වය, සේවක සංඛ්‍යාව, වෙළෙඳපොළට නිෂ්පාදන සපයන ආකාරය, කර්මාන්ත හිමියන්ගේ අධ්‍යාපන තත්ත්වය සහ නව තාක්ෂණය භාවිතා කිරීමේ හැකියාව යනාදී සාධක කිනම් බලපෑමක් සිදු කර ඇතිදැයි අධ්‍යයනය කළ අතර මෙහි අවසාන නිගමනය වූයේ කර්මාන්ත අයිතියේ ස්වභාවය හැර අනෙකුත් සාධක සංචාරක කර්මාන්තය ආශ්‍රිත කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත සංවර්ධනය කෙරෙහි සැළකිය යුතු බලපෑමක් සිදුකර ඇති බවයි.

***ප්‍රමුඛ පද:*** කුඩා සහ මධ්‍ය පරිමාණ කර්මාන්ත ; දක්ෂිණදිග සංචාරක වෙරළතීරය; සංචාරක කර්මාන්තය; සංවර්ධනය